# PAFFREL

නිදහස් හා සාධාරණ මැතිවරණයන් සඳහා ජනතා ක්‍රියාකාරීත්වය.

சுதந்திரமானதும் நீதியானதுமான தேர்தல்களுக்கான மக்கள் செயற்பாடு.

PEOPLE'S ACTION FOR FREE & FAIR ELECTIONS


2016.10.21

ගරු සභාපති තුමා,
පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යංශය,
සීමා නිර්ණය අභියාචනා කමිටුව,
නො. 330, යුනියන් පෙදෙස,
කොළඹ 02.

ගරු සභාපති තුමනි,

**පළාත් පාලන ආයතනවල සීමා නිර්ණය අවසන් කිරීම සඳහා කල් ලබා ගැනීම**

පළාත් පාලන මැතිවරණ දිගින් දිගටම කල් යැමට ප්‍රධාන හේතුවක් ලෙස සැළකෙන පළාත් පාලන ආයතනවල සීමා නිර්ණය කටයුතු අවසන් කිරීම සඳහා ඔබ තුමන්ගේ ඉල්ලීම පරිදි තවදුරටත් කාලය දීර්ඝ කළ බව මාධ්‍ය හරහා දැනගැනීමෙන් අප පුදුමයටත්, කණගාටුවටත් පත්වූවෙමු.

පසුගිය රජය මගින් පත්කරන ලද සීමා නිර්ණය කමිටුව මගින් කරන ලද සීමා නිර්ණය කිරීම් පිළිබඳව ගැටලු පැවැති බව අපද විශ්වාස කරමු. එමෙන්ම එම ගැටළු නිරාකරණය කළ යුතු බවද ඒ සඳහා යම් කාලයක් ගතවන බවද අප පිළිගනිමු.

එහෙත් මේ වන විට ඔබ කමිටුව ඒ සඳහා වසරකට ආසන්න කාලයක් ගතකොට ඇත. සීමා නිර්ණය ගැටලු අවසන් කර වාර්තාව එළි දැක්වීම පිළිබඳ දින වකවානු අවස්ථා ගණනාවකදී ලබා ඇති අතර අවසන් දිනය ලෙස මේ මස 31 වන දින ප්‍රකාශයට පත්වූවද නැවත වරක් ඔබතුමාගේ ඉල්ලීම පිරිදි එය දෙසැම්බර් 31 දිනය දක්වා කල්දැමුණු බව වාර්තාවේ.

මේ වන විට පළාත් පාලන මැතිවරණ කල් දැමීමට ප්‍රධාන හේතුව ලෙස රජය ඉදිරිපත් කරනු ලබන්නේ සීමා නිර්ණය අවසන් නොකිරීමේ ගැටළුවයි. එමෙන්ම පනතේ ඇති ගැටලු නොසලකා සීමා නිර්ණය අවසන් වූ පසු මැතිවරණ පැවැත්වීමට සූදානම් බව මැතිවරණ කොමිෂන් සභාවේ සභාපති තුමා දේශපාලන පක්ෂ නියෝජිතයන් සමග පසුගිය සතිය තුළ පැවැති සාකච්ජාවේදී සඳහන් කරන ලදී.

ගරු සභාපති තුමනි, ඔබ තුමන් රාජ්‍ය සේවය තුළ සිටි කීර්තිමත් නිලධාරියෙකි. එමෙන්ම දේශපාලන පක්ෂ, ජනතාව ඔබතුමන් කෙරෙහි පූර්ණ විශ්වාසය තැබූවෙමි. එහෙත් දිගින් දිගටම සීමා නිර්ණය කල්යාම හරහා එය දේශපාලන අවශ්‍යතා මත කල් දැමෙන බවට ජනතාව තුළ ඇතිවන සාධාරණ සැකය කීර්තිමත් රාජ්‍ය නිලධාරියෙකු වූ ඔබතුමාගේත්, ඔබ කමිටුවේත් ගෞරවයට හානියකි. ජනතා පරමාධිපත්‍යය නොසලකා හැරීමකි. එබැවින් මේ පිළිබඳව ගැඹුරින් සළකා බලා සීමා නිර්ණයට අදාළ ගැටලු කඩිනමින් විසඳීමට ක්‍රියාකරන ලෙසත්, ඔබ විසින් දැනටමත් අවසන් කර ඇති ප්‍රමාණය, ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා අමාත්‍යවරයාට ඉදිරිපත් කරන ලෙසත් විසඳිය නොහැකි ගැටළු මොනවාද යන්න ජනතාවට ඉදිරිපත් කරන ලෙසත් ගෞරවයෙන් ඉල්ලා සිටිමු.

ස්තූතියි.
මෙයට විශ්වාසී,

රෝහණ හෙට්ටිආරච්චි,
විධායක අධ්‍යක්ෂ.

පිටපත - සභාපති තුමා, මැතිවරණ කොමිෂන් සභාව

උනන්දුවක් දක්වන සෙසු ආයතන.


# 12/3, Robert Terrace, Robert Gunawardana Mawatha, Colombo 06, Sri Lanka.
Tel : (+94) 11 2514441 / 11 2514442 Fax : (+94) 11 2514443
E-mail : paffrel@sltnet.lk Website : www.paffrel.lk